කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

| 7 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය : පැය දෙකයි |
|---|---|---|

නම :...........................................................................................

1 කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

01).ලෝකයේ විශාලතම සාගරය මේ අතරින් කුමක් ද?

I.ඉන්දියන් සාගරය    ii. අත්ලන්තික් සාගරය

iii.පැසිෆික් සාගරය    iv. ඇන්ටාක්ටික් සාගරය

02).ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරය ලෙස සැලකෙන්නේ,

i.කොළඹ ය.    Ii. මහනුවර ය.

iii.ගම්පහ ය.    Iv. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ය

03). තෙත් කලාපයේ ජන සංඛ්‍යාව ඒකරාශී වීමට බලපාන හේතුවක් නොවන්නේ මින් කුමක් ද?

i. වී ගොවිතැන සඳහා යට වූ බිම් ප්‍රමාණය වැඩිවීම    ii. යටිතල පහසුකම් තිබීම

iii. කාර්මික ජනපද පිහිටීම    iv. වෙළඳ කලාප පිහිටා තිබීම

04). අඩතැනි කලාපයේ තිබෙන ශේෂ කඳු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

i. දඹුල්ල , සීගිරිය, රිටිගල, නකල්ස්

ii. දඹුල්ල , නමුණුකුල, රිටිගල, කතරගම

iii. නමුණුකුල, සීගිරිය, නකල්ස්, කතරගම

iv. දඹුල්ල , සීගිරිය, රිටිගල, කතරගම

05). යාපන අර්ධද්වීපය ආශ්‍රිතව පිහිටි කුරුලු අභය භූමිය ,

i. කුමන    ii. විල්පත්තු    iii. චුණ්ඩිකුලම්    iv. යාල

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ කියවා නිවැරදි නම් (√ ) ලකුණ ද වැරදි නම් (X) ලකුණද යොදන්න

06). කැලණි ගංගාවේ පිටාර තැනි ආශ්‍රිතව එළවළු හා කොරටු වගාව ප්‍රධාන වේ.    (   )

07). බ්‍රිතාන්‍යයේ ග්‍රිනිච් නගරය හරහා ඇඳ ඇති 0° රේඛාව සමකය නම්වේ. ( )

08). භෞතිකව දැකිය නොහැකි මානව හැසිරීම් වලින් අනාවරණය වන දෑ අස්පෘශ්‍ය උරුම නම්වේ. ( )

09).ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වෙන පටු නොගැඹුරු මුහුදු තීරය මලක්කා සමුද්‍ර සන්ධිය නම්වේ. ( )

10).සිතියමක් කියවීමට සුචිය දක්වා තිබීම වඩා ප්‍රයෝජනවත් වේ. ( )

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති වගන්තිවල හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර ලියන්න.

11).ලෝකයේ ස්වභාවික රබර් නිෂ්පාදනයෙන් 95% සපයනු ලබන්නේ ........................................... රටවලිනි.

12). ශ්‍රී ලංකාවේ දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුවට දුර කි. මී. ..................................... කි.

13). .......................... ආරක්ෂා කර ගැනීමට දඬුවැට තනනු ලබයි.

14). අන්තර්ජාතික සාගර නීතිය අනුව ලොව වෙරළක් සහිත සෑම රටකට ම වෙරළ මායිමේ සිට නාවික සැතපුම් 12ක ප්‍රමාණයක් ලබා දී ඇත. එය ........................ නම්වේ.

15). වියළි කලාපය ආශ්‍රිතව අතීත ............. ශිෂ්ටාචාරය ආරම්භ විය.

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති වගන්තිවල හිස්තැන සඳහා සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

16).ආදර්ශ ගෝලයේ උතුරුහා දකුණු ධ්‍රැව යා කර ඇති රේඛා .................. නම් වේ.

( දේශාංශ, අක්ෂාංශ, සමකය)

17). ශ්‍රී ලංකාවේ අධික ජන සංඛ්‍යාවක් වාසය කරන්නේ ...................... කලාපයේ ය.

(වියළි, තෙත්, කඳුකර)

18).ශ්‍රී ලංකාවට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ ...................... මඟිනි.

( වාසුළි, ඊසානදිග මෝසම්, නිරිතදිග මෝසම්)

19).යාපන අර්ධද්වීපය ආශ්‍රිතව .................. දූපත පිහිටා ඇත.

(මන්නාරම, කයිට්ස්, මැඩගස්කරය)

20). දකුණු ආසියානු රටවල් අතර සාක්ෂරතාව ඉහළ ම රට ................ ............ යි.

( මාල දිවයින, පකිස්ථානය, ශ්‍රී ලංකාව)


11 කොටස

පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.

තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

01). ලෝක ආකෘති සිතියමේ A සිට H දක්වා ලකුණු කර ඇති ස්ථාන නම් කරන්න. ( ලකුණු 2X8 = 16)





02). I)පෘථිවියට තම අක්ෂය වටා භ්‍රමණය වීමට ගත වන කාලය හා සූර්යයා වටා භ්‍රමණය වීමට ගත වන කාලය දක්වන්න. (ලකුණු 02)

ii) රටක පිහිටීම දක්වන ක්‍රම දෙක මොනවා ද? (ලකුණු 04)

iii) පෘථිවිය පූර්ණ ගෝලයක් නොවේ යැයි කියන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

03).i) උතුරු අක්ෂාංශ 90° හා දකුණු අක්ෂාංශ 90° හඳුන්වන නම් මොනවා ද? (ලකුණු 02)

ii)මෙහි දැක්වෙන ABCD වලින් පෙන්නුම් කරන රේඛා නම් කරන්න. (ලකුණු 04)



iii)ශ්‍රී ලංකාව සංචාරක ආකර්ෂණය දිනාගෙන සිටින රටකි. එයට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

04). i) වෙරළබඩ තැනිතලාවේ දැකිය හැකි භූ ලක්ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 02)

ii)ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන වෘක්ෂලතා කලාප හතරක් ලියන්න. (ලකුණු 04)

iii) ශ්‍රී ලංකාවේ එක් දේශගුණික කලාපයක් නම් කර එහි වෘක්ෂලතාවල ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 05)

05). i) බහු වාර්ගික සමාජයක ලක්ෂණ දෙකක් ලියන්න? (ලකුණු 02)

ii) ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුම දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii) ශ්‍රී ලංකාව සමාජයීය සංවර්ධනය අතින් ආසියානු කලාපයේ ඉහළ මට්ටමක සිටී. ඊට බලපා ඇති හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

06).i)වියළි කලාපීය භූ දර්ශනය තුළ පිහිටා ඇති වනෝද්‍යාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii)තෙත් කලාපයේ ජන සංඛ්‍යාව අධික වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii)ශ්‍රී ලංකාවේ භූ දර්ශනය ප්‍රාදේශීයව විවිධ වේ.ඉන්එක් භූ දර්ශනයක් තෝරාගෙන එහි මානව කටයුතු සිදුකෙරෙන ආකාරය සාකච්චා කරන්න. (ලකුණු 05)

07) i).හේන් වල වගා කරන ධාන්‍ය වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාව කෙරෙහි සංචාරක ආකර්ෂණය බහුල වීම කෙරෙහි බලපා ඇති හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

iii. ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි සංචාරක කර්මාන්තයේ දායකත්වය කරුණු දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05)